රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 139

මගේ අංකය: 546ඊ1251/8 ඩ
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශය, ආයතන අංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1979 මැයි මස 03 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත මණ්ඩල
ප්‍රධානීන් වෙත,

<u>උසස් කිරීමේ බලධාරියාගේ ප්‍රමාදයන් හා පමාවූ උසස්වීම්</u>

කිසියම් නියමිත දිනක සිට උසස්වීමක් ලැබිය යුතු නිලධාරියෙක්, උසස්කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්නය එම නිලධාරියා තවදුරටත් සේවයේ නැතිවිට හෝ ඔහු මියගිය පසු හෝ, පත්කිරීමේ බලධාරියා සලකා බැලීම නිසාම ඔහුට උසස්වීම අහිමිකිරීම සාධාරණ නොවේ.

2. නිලධාරියෙකුගේ උසස්වීම සම්බන්ධයෙන් තීරණය ගැනීමට ප්‍රමාදවීම, එනම් නිලධාරියා තවදුරටත් සේවයේ නැතිවිට හෝ ඔහු මියගිය පසු තීරණයක් ගැනීම සම්බන්ධයෙන් නිලධාරියා කිසියම් ලෙසකින් වගකිව යුත්තේ නොවේනම්, තීරණය ගන්නා අවස්ථාව එනවිට ඔහු විශ්‍රාම ගොස් හෝ මියගොස් ඇත්තේවී නමුදු නියමිත දිනයේ දී ඔහුට උසස්වීම දිය යුතුය.

3. නිලධාරියෙකුට ජ්‍යෙෂ්ඨත්වය එහා සමඟක්ම උසස්වීම ලැබීමට අයිතිවාසිකමක් නැති වුවද ඔහු උසස්වීම ලැබීමට සුදුසුයයි සලකන්නේ නම් එම නිලධාරියා සේවයේ සිටියේ නම් සාමාන්‍ය ක්‍රමය අනුව ඔහු උසස්වීම ලබනු ඇත්දැයි යන්න පිළිබඳව පත්කිරීමේ බලධාරියාට තීරණයක් ගත හැක. එවැනි අවස්ථාවල දී පුරප්පාඩුව ඇතිවූ දින සිට ඔහුට උසස්වීම දිය යුතුය.

4. මෙම චක්‍රලේඛය අදාළ වනුයේ, සේවාවක ශ්‍රේණියෙන් ශ්‍රේණියට කෙරෙන උසස්වීම් සම්බන්ධයෙන් පමණි.

5. ආයතන සංග්‍රහයට අවශ්‍ය සංශෝධන යථා කාලයේ දී කරනු ඇත.

Siriwardhana

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ලේකම්.